## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2016

---------------------------------------------------

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------

ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයක් වන අත්තිකාරම් ශේෂයට වත්කම් ඉවත් කිරීම් ගිණුමක බැර ශේෂය හිලව් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

-----------------------------------

මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරන ලද නඩු වෙනුවෙන් අයකරගත යුතු මුදල ආසන්න වශයෙන් රු.2,100,000 ක් බවට මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වත්කම් යටතේ හෙළිදරව් කර තිබුණද එම පාර්ශවයන් හා එකී පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

-----------------------------------

මණ්ඩලයේ වෙබ් අඩවිය සංවර්ධන කිරීම සඳහා වැය කරන ලද රු.5,128,000 ක මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

ඉන්ටර්ෂූ ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අපනයනකරුවන්ගෙන් අය කළ ගාස්තුව ලෙජරයට අනුව රු.1,783,025 ක් වූ නමුත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, එය රු.1,708,051 ක් වූයෙන් රු.74,974 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ප්‍රසාද දීමනා | 2,623,013 | භාණ්ඩාගාර අනුමැතිය හා ගණනය කිරීම් පිළිබඳ විස්තර. |
| (ආ) | ලැබිය යුතු ශේෂ | 157,757,770 | උපලේඛන හා කාල විශ්ලේෂණ. |
| (ඇ) | උපචිත වියදම් | 28,445,924 | උපලේඛන හා කාල විශ්ලේෂණ. |
| (ඈ) | අපනයන ප්‍රවර්ධන වැඩසටහන් | 41,053,000 | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ, අපනයනකරුවන් තෝරා ගැනීමේ පරිපාටි, ප්‍රතිපූර්ණ වියදම් ලැයිස්තු හා ලිපිගොනු. |
| (ඉ) | විදේශ ගමන් වියදම් | 667,985 | දීමනා ගණනය කිරීම්වල නිරවද්‍යතාව තහවුරු කරගැනීමට අවශ්‍ය ගුවන් ටිකට්පත් හා විදේශ ගමන් බලපත්. |

### 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

කොහු ආශ්‍රිත නිෂ්පාදනවල අගය වැඩිකිරීම සඳහා අනුග්‍රහය සැපයීමේ වැඩසටහන යටතේ මණ්ඩලය විසින් පෞද්ගලික සමාගමක් සමග 2014 ජූලි 27 දින එළඹි ගිවිසුම, 2015 ඔක්තෝබර් 26 දිනෙන් අවසන් වී තිබුණද එදිනෙන් පසුව රු.450,648 ක් ගෙවා තිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 හා 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 44 වගන්ති | සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී විශේෂ දීමනා, වෘත්තීය දීමනා , අන්තර් දීමනා හා අනුමත නොවූ විශේෂ ජීවන වියදම් දීමනා ඇතුළත් කිරීම හා ජීවන වියදම් දීමනාව ඇතුළත් නොකිරීම මත විගණනයට භාජනය වූ 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට රු.5,508,199 ක් හා සේවක භාරකාර අරමුදලට රු.659,375 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 11.1 වගන්තිය | ගුවන් මගින් කරනු ලබන සියලුම ගමන් පිරිමැසුම් පන්තිය උපයෝගී කරගෙන යායුතු වුවත් මණ්ඩලයේ සභාපතිනිය හා විධායක අධ්‍යක්ෂ විසින් ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශ පත්‍ර ලබාගෙන තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
-------------------------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 103(1)(ආ) හා 104(1) | 2016 වර්ෂයේ දී සිදු වී ඇති වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
----------------------------

| | |
|---|---|
| (i) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 හා 2007 ජුනි 12 දිනැති අංක 15/2007 දරන චක්‍රලේඛ | 2005 ජනවාරි 01 දින සිට බැංකු මගින් දේපළ ණය ලබා දීම කළ යුතු වුවත් මණ්ඩලය රජයේ ප්‍රදාන භාවිතා කරමින් මණ්ඩලය විසින්ම ණය ලබා දී තිබුණි. තවද, චක්‍රලේඛයේ උපදෙස් නොසලකා මුළු ණය මුදල සඳහා සියයට 4.2 ක ප්‍රතිශතයක් ලෙස පොලිය අය කර තිබූ අතර, මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන චක්‍රලේඛය | විදේශ ගමන් සඳහා සහභාගී වීමේදී ලබා ගත යුතු අග්‍රාමාත්‍ය අනුමැතිය විදේශ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වූ නිලධාරීන් සඳහා ලබා ගෙන නොතිබුණි. |
| (ඉ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර එම වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කර අවසන් කළ යුතු අතර ඊළඟ වර්ෂයේ මාර්තු 31 දින වන විට භාණ්ඩ සමීක්ෂණයේ කටයුතු අවසන් කර එම වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 ජුනි 28 දින වන විටත් 2016 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඊ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය | කාර්තුවක් අවසන් වී දින 30 ක් තුළ රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට කාර්තුමය කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මණ්ඩලයේ අවුරුදු 25 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට රන් පවුම් ලබා දීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.478,002 ක් වැය කර තිබුණද, සිය සේවකයින්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කිරීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**
------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.45,773,906 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.70,144,039 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.24,370,133 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු.98,319,963 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ ශුද්ධ අලාභයක් හා 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ ශුද්ධ ලාභයක් ඇති වී තිබුණු අතර එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.154,726,961 ක් වූ දායකත්වය 2013 වර්ෂයේදී රු.287,157,318 ක් දක්වා එනම් සියයට 85 කින් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් ඉන්පසු වර්ෂවලදී එය සුළු වශයෙන් පිරිහී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දායකත්වය රු.238,522,796 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුව අරමුණු පහත දැක්වේ.

(i) මහින්ද චින්තන - ඉදිරි දැක්ම අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වර්ෂ 2020 දී ඇ.ඩොලර් බිලියන 20 දක්වා ඉහළ නැංවීම.

(ii) යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළඳපලවලට කරනු ලබන ශ්‍රී ලංකාවේ අපනයන ස්ථාවරව පවත්වා ගන්නා අතරතුර, අනෙකුත් විදේශ වෙළඳපලවලට කරනු ලබන අපනයන, සමස්ත අපනයන ඉපැයුමෙන් සියයට 50 කට වඩා වැඩි මට්ටමකට ඉහළ නැංවීම.

(iii) ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමට සියයට 80 ක් පමණ දායක කරනු ලබන හඳුනාගත් ප්‍රමුඛ භාණ්ඩ හත පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්, ඒවායේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.

(iv) ඒකාබද්ධ අලෙවි සන්නිවේදන වැඩසටහන් තුළින්, ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ හා සේවා පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් අන්තර්ජාතිකව ඇති කිරීම.

(v) අපනයන වෙළඳාමේ ප්‍රතිලාභ, එම ක්ෂේත්‍රයේ නියැලෙන සියලු පාර්ශවයන්ටම සහ දිවයිනේ සෑම පළාතකටම ගලා යාමට සැලැස්වීම.

(vi) සේවක ඵලදායීතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ආයතනයේ මූලික වටිනාකම් මත ගොනු වූ විශිෂ්ඨ කණ්ඩායමක් මණ්ඩලය තුළ බිහි කිරීම.

ඉහත අරමුණු ක්‍රියාවට නැංවීම පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්යසාධන වාර්තාව තුළ එක් එක් ක්‍රියාකාරකම්වලට අදාළ භෞතික ප්‍රගතිය සඳහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ නමුත් වර්ෂය තුළ ක්‍රියාත්මක නොකරන ලද වැය ක්ෂේත්‍ර 8 ක් යටතේ වූ ක්‍රියාකාරකම් 11 ක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා ප්‍රතිපාදිත මුදල රු.28,650,000 ක් විය. වැඩසටහනේ යෝග්‍යතාවය පිළිබඳ පූර්ව අවබෝධයකින් කටයුතු නොකිරීම, මණ්ඩලයේ අරමුණු හා සම්බන්ධ වැඩසටහන් තෝරා නොගැනීම, වැඩසටහන් හා සම්බන්ධවන ආයතන සහ පුද්ගලයන් සමඟ පූර්ව සාකච්ඡා නොපැවැත්වීම හා දැනුවත් නොකිරීම මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට බලපෑ ප්‍රධාන හේතු විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළ අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වල පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අපයනයකරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමේදී ඉංග්‍රීසි පුවත්පත්වල පමණක් පල කිරීම නිසා අපනයනකරුවන් වැඩි පිරිසකට එම ප්‍රදර්ශනවලට සහභාගී වීමට තිබූ අවස්ථාව සීමා වී තිබුණි.

(ii) අපනයනකරුවන් තෝරා ගැනීම සඳහා පත් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විධිමත්ව පත් කර නොතිබුණි.

(iii) අපනයනකරුවන් තෝරාගැනීමේදී ලකුණු ලබාදීමේ නිර්ණායක හා සීමාවන් පූර්වයෙන් නිර්ණය කර තිබුණද ඇතැම් අපනයනකරුවන්ට ලකුණු ලබා දීමේ පදනමක් නොවීය. එබැවින් අපනයනකරුවන්ට විදේශ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(iv) වැඩි අපනයන ආදායම් උපයන මූල්‍ය දුෂ්කරතාවයන් නොමැති සමාගම් සඳහා වැඩි ලකුණු ලබා දෙමින් රජය මගින් මූල්‍යාධාර දීම සිදු කර තිබීමෙන් හා අඩු අපනයන ආදායම් උපයන සමාගම් සඳහා අඩු ලකුණුද ලබා දීම හේතුවෙන් අපනයන ප්‍රවර්ධනය කිරීමේ කාර්යය නිසියාකාරව ඉටු වී නොතිබුණි.

(v) විදේශ කොටස් අයිතිය ඇති සමාගම් සඳහා වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීමේ අවස්ථාව ලබා දීම නිසා දේශීය අපනයනකරුවන්ට ලැබිය යුතු අවස්ථාව අහිමි වී තිබුණි.

(vi) විදේශ වෙළඳ ප්‍රදර්ශනවල වෙළඳකුටි ඉදිකිරීමේ හා ඉඩකඩ වෙන්කිරීමේ පිරිවැය වෙනුවෙන් මණ්ඩලයේ දායකත්වය සම්බන්ධයෙන් ඒකීය ප්‍රතිපත්තියක් නොතිබුණි.

(vii) විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීමේදී මණ්ඩලය අපනයනකරුවන් සමග ගිවිසුම්වලට ඇතුළත් නොවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඇතුළත්ව තිබූ ගිවිසුම් අඩුපාඩු සහිතවූ බැවින් වලංගුතාවයක් නොවීය. එබැවින් ගිවිසුම් කඩවූ අවස්ථා ඇතිවූ විට නීතිමය කටයුතු කිරීමේ අවස්ථාව ඇහිරී තිබුණි.

(viii) විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගී කරවීමේ අරමුණ සාක්ෂාත් කරගත්තේද යන්න හා අපනයන ප්‍රගතිය සම්බන්ධයෙන් මණ්ඩලය පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා වැඩසටහන් සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමේදී නිසි තොරතුරු ඇතුළත් නොකිරීම හා කාලානුරූපව කටයුතු නොකිරීම නිසා අවස්ථා දෙකකදී එකම කරුණ සඳහා පුවත්පත් දැන්වීම් 2 ක් පල කර තිබූ අතර, එහිදී පළමු පුවත්පත් දැන්වීම සඳහා වැය කළ රු.698,140 ක් අනාර්ථික වියදමක් වී තිබුණි.

(ආ) පෞද්ගලික සමාගම් 35 ක සාමාන්‍ය කොටස්වල කරන ලද ආයෝජන රු.58,312,484 ක් හා පෞද්ගලික සමාගම් 30 ක වරණීය කොටස්වල කරන ලද ආයෝජන රු.105,058,084 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද සමාගම් නාම ලේඛනයේ ලියාපදිංචි වී නොමැති සමාගම්, සමාගම් නාම ලේඛනයෙන් නම කපා හැර ඇති සමාගම් හා විසුරුවා හැර ඇති සමාගම් ද ඊට ඇතුළත් කර තිබුණි. කාලානුරූපව ආයෝජන සමාලෝචනය කර ඇතිවිය හැකි ප්‍රාග්ධන අලාභයන් වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

තවද මෙම ආයෝජනයන් සඳහා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකම අගයක් එනම් රු.122,822,417 ක් හානිකරණ ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබුණු අතර ආයෝජන සමාලෝචනයට ලක්කර හානිකරණ ප්‍රතිපාදන සඳහා ගැලපීම් කර නොතිබුණි.

(ඇ) අනුමත වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් වර්ෂය තුළ රු.17,983,900 ක් වැය කර තිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන ඒකකය විසින් සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී විගණන විමසුම් 2 ක් නිකුත් කර තිබූ නමුත් එම විමසුම්වලින් කළමනාකරණයට පෙන්වා දුන් ක්‍රියාත්මක කළ යුතු නිර්දේශයන් මණ්ඩලය ක්‍රියාත්මක කළ බවට ප්‍රධාන අභ්‍යන්තර විගණකට වාර්තා කර නොතිබුණි.

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

අපනයනකරුවන් තෝරා ගැනීම සඳහා කමිටු දෙකක් පත් කර තිබූ අතර කමිටු දෙකම එකම කාර්යභාරය සිදුකර තිබූ බැවින් දෙවන කමිටුවට ගෙවූ රු.265,000 ක මුදල ඵලදායී වී නොතිබුණි.

### 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

කුරුඳු නිෂ්පාදනයන්හි අගය එකතු කිරීමේ අනුකූලතාවය උසස් කිරීම, ඵලදායී ධාරිතාවය හා තරඟකාරීත්වය වැඩි කිරීමේ අරමුණින් 2013 අයවැය යෝජනා මගින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හරහා වැය කිරීමට රු.28,500,000 ක මුදලක් වෙන් කර තිබුණද නිසි කාල රාමුව තුළ කටයුතු නොකිරීම නිසා එම මුදල මණ්ඩලයට නොලැබිණි. පසුව මණ්ඩලයට ලැබෙන වාර්ෂික ප්‍රතිපාදනවලින් කුරුඳු පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් ප්‍රසම්පාදන ක්‍රියාවලයකින් තොරව රු.26,373,010 කට පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණද මධ්‍යස්ථානය ඉදිකරන ඉඩමේ අයිතිය මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි. මණ්ඩලය හා කොන්ත්‍රාත්කරු අතර ඇති කර ගෙන තිබූ ගිවිසුමේ 2.2 වගන්තිය අනුව 2013 නොවැම්බර් 01 දිනෙන් ආරම්භ වන වසර 3 ක් ඇතුළත මෙම මධ්‍යස්ථානය නිම කර මණ්ඩලයට භාර දිය යුතු වුවත් 2017 සැප්තැම්බර් 29 දින වන විටත් මණ්ඩලය මධ්‍යස්ථානය භාර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වර්තමානය වන විට එම සමාගම ගාස්තු අයකර කුරුඳු සම්බන්ධ පුහුණු පාඨමාලා පවත්වන බව නිරීක්ෂණය විය.

තවද මණ්ඩලය විසින් මධ්‍යස්ථානය සඳහා වැය කළ මුදල ප්‍රාග්ධනීත නොකර අයභාර වියදමක් ලෙස හඳුනා ගෙන තිබුණ අතර කොන්ත්‍රාත් සමාගමේ ගිණුම්වල මෙම වියදම මණ්ඩලයෙන් ලැබුණු ප්‍රදානයක් ලෙසද ගොඩනැගිල්ල වත්කමක් වශයෙන්ද ගිණුම්ගත කර තිබුණි. කුරුඳු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ සම්බන්ධිකරණ නිලධාරිනිය වශයෙන් කටයුතු කළ මණ්ඩලයේ කෘෂි අපනයන අංශයේ වත්මන් අධ්‍යක්ෂ 2016 මැයි 30 දින සිට Cinnamon Training Academy (pvt) Limited හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 අනුව 2016 මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

### 4.5 හඳුනා ගන්නා ලද පාඩු

--------------------------

ජර්මනියේ පැවැති ඉන්ටර් ෂූ ප්‍රදර්ශනය සඳහා සහභාගී වන අපනයනකරුවන් පිළිබඳව නිශ්චිතව තහවුරු කර නොගැනීම නිසා සහභාගී නොවූ අපනයනකරුවකු වෙනුවෙන් මණ්ඩලය දැරූ අමතර වියදම රු.294,621 ක් විය.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 මාර්තු වන විට මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන් 209 දෙනාගෙන් 150 කට රාජකාරී පැවරීම සිදු කර නොතිබුණි. රාජකාරී පැවරීම් කර තිබූ නිලධාරීන් 59 දෙනාගෙන් එක් නිලධාරියකුට පමණක් සභාපතිගේ අත්සනින් රාජකාරී පවරා තිබුණ අතර අංශ ප්‍රධානීන් විසින් පවරා තිබූ සමහර රාජකාරී පැවරීම් අත්සන් කර නොතිබුණි. එක් එක් නිලධාරියාගේ රැකියා විස්තරය අනුව වගකීම පැවරෙන පරිදි රාජකාරී පැවරීම සිදු කර නොතිබුණු බැවින් නිලධාරියා පිළිබඳ නිසි ඇගයීමක් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) අධ්‍යක්ෂ (මානව සම්පත්), අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) හා අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) තනතුරු සඳහා බඳවා ගැනීම පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මූලික සුදුසුකම් පරීක්ෂාව සඳහා වූ කමිටුවක් විසින් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කර තිබුණද එම වාර්තා අත්සන් කර නොතිබුණි. මූලික සුදුසුකම් පරීක්ෂා කළ කමිටුවට බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් පිළිබඳව අවබෝධයක් නොමැතිව තිබියදී හා එම කමිටුවට අයදුම්කරුවන් සුදුසුද නැද්ද යන්න තීරණය කිරීමට බලතල ලබා දී නොමැතිව තිබියදී අයදුම්කරුවන් සුදුසුද නැද්ද යන්න තීරණය කර තිබුණි. මෙම වාර්තාව අනුව නුසුදුසු අයදුම්කරුවන් සුදුසු ලෙස නම් කර තිබුණි.

(ii) මේ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 2 ක් නම් කර තිබුණ ද එම කමිටුවල සාමාජිකයින් විධිමත්ව පත්කර නොතිබුණි. තවද සම්මුඛ පරීක්ෂණ වාර්තා එකක් පමණක් කළමනාකරණයට ඉදිරිපත් කර තිබූ බැවින් එක් කමිටුවක් අක්‍රීය තත්ත්වයේ තිබුණි. මූලික සුදුසුකම් පරීක්ෂා කළ කමිටු වාර්තාව අනුව නුසුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුසු අයදුම්කරුවන් වශයෙන් නම් කර තිබුණි.

(iii) බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා සුදුසුකම් ලැබීමට බාහිර අයදුම්කරුවකුට පිළිගත් උපාධියක්, අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ එම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබිය යුතුය. එහෙත් එම සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු බාහිර අයදුම්කරුවකු ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 6.1.3 වගන්තියේ විධිවිධානවලට පටහැනිව එම තනතුර පුරප්පාඩුවීමට මාසයකට පෙර බඳවාගෙන තිබුණි

(iv) මණ්ඩලයේ අනුමත බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) තනතුර සඳහා බාහිර අයදුම්කරුවකු පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධියක් සමග වසර 15 ක කළමනාකරණ තනතුරක පළපුරුද්ද සපුරා තිබිය යුතු වුවත් එම සුදුසුකම් නොලැබූ අයදුම්කරුවකු බඳවා ගෙන තිබුණි.

(v) ඉහත තනතුරු දෙක සඳහා සුදුසුකම් අනුව ශ්‍රේණිගත කිරීමේදී අභ්‍යන්තර අයදුම්කරුවන් සුදුසුකම් ලබා තිබුණද, එම නිලධාරීන්ට මෙම තනතුරුවලට පත් වීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(vi) මණ්ඩලයේ අනුමත බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරට අභ්‍යන්තරිකව බඳවා ගන්නේ නම් පශ්චාත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ MM 1.1 කාණ්ඩයේ පළමු ශ්‍රේණියේ තනතුරක වසර 5ක පළපුරුද්දක් ලබා තිබිය යුතු වුවත් එවැනි පළපුරුද්දක් නොතිබූ අලෙවි සංවර්ධන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස සේවය කළ නිලධාරිනියකට සම්මුඛ පරීක්ෂණයකින් තොරව එම පත්වීම ලබාදී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් අදාළ ක්ෂේත්‍රයේ යන්න ඉවත් කරමින් නිලධාරීන් බඳවා ගැනීම සිදුකර තිබූ අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) අපනයන ප්‍රවර්ධන නිලධාරී, පරිපාලන නිලධාරී, සංවර්ධන නිලධාරී, ගිණුම් නිලධාරී තනතුරු ඇතුළුව තවත් තනතුරු 10 ක පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අපනයන ප්‍රවර්ධන නිලධාරී තනතුරට උසස් කිරීම සඳහා පැවැත්වූ ලිඛිත විභාගයේ භාෂා ප්‍රවීනතාව හා විෂය දැනුම යන විෂයයන් දෙකෙන් මණ්ඩලයේ එක් නිලධාරිණියක් නිදහස් කර එම තනතුරට හා සහකාර අධ්‍යක්ෂවරු 09 ක් බඳවා ගැනීමට සංශෝධනය කළ බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2016 අගෝස්තු 21 දින පැවැත් වූ විභාගයේ ප්‍රතිඵල මත බාහිර අයදුම්කරුවන් 5 ක් හා අභ්‍යන්තර අයදුම්කරුවන් 4 ක් බඳවා ගෙන තිබුණි. විෂයයන් 3 කින් සමන්විත මෙම විභාගයේ ඉංග්‍රීසි විෂයය සඳහා ලබා දුන් කාලය ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් අභ්‍යන්තර අයදුම්කරුවන් කරන ලද ඉල්ලීමකට අනුව ඉංග්‍රීසි විෂයයට පමණක් නැවත විභාගය පවත්වා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දින විගණකාධිපතිට ඉදිරිපත් කර තිබුණ ද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය හා ප්‍රසම්පාදන සැලැස්ම යන කරුණු මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ අඩංගු එක් එක් ක්‍රියාකාරකම් සඳහා ආරම්භ කිරීමට හා අවසන් කිරීමට අපේක්ෂිත දිනය, නිම කිරීමට අපේක්ෂිත භෞතික ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2015 ක්‍රියාකාරී සැලැස්මෙහි රු.3,100,000 ක් ප්‍රතිපාදන වෙන් කරන ලද එහෙත් ක්‍රියාවට නැංවීම 2016 වසරට කල්දමන ලද වැඩසටහන් 4 ක් නිරීක්ෂණය වූවද එම වැඩසටහන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි වැය ක්ෂේත්‍ර 08 ක් යටතේ රු.20,200,000 ක ප්‍රතිපාදන සලසමින් ක්‍රියාවට නංවන ලද, එහෙත් එම වර්ෂය තුළදීම සම්පූර්ණයෙන් නිම කිරීමට අපොහොසත් වූ ක්‍රියාකාරකම් 11 ක් පිළිබඳ ඉතිරි වැඩ කොටස් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රතිපාදන සලසමින් ක්‍රියාවට නංවන ලද නමුත් එම වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කිරීමට අපොහොසත් වූ ක්‍රියාකාරකම් 07 ක් 2017 වර්ෂයට ඉදිරියට ගෙන ගොස් තිබුණි. එහෙත් මෙය තහවුරු කර ගැනීම සඳහා 2017 ක්‍රියාකාරී සැලැස්ම 2017 ජූනි 28 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**5.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

මණ්ඩලය විසින් වාර්ෂිකව පැවැත්විය යුතු ජනාධිපති අපනයන සම්මාන උළෙල 2010 සිට 2013 දක්වා වර්ෂ වෙනුවෙන් 2015 වර්ෂයේදී ද 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් 2016 වර්ෂයේදී ද පවත්වා තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මෙම උළෙල සඳහා රු.5,800,000 ක් වැයකර තිබූ අතර අවම පිරිවැයක් යටතේ සිද්ධි කළමනාකරණ සමාගමක් තෝරා ගැනීමේදී සිදු වී තිබූ පාඩුව රු.468,250 ක් විය.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ එක් එක් වැය ක්ෂේත්‍රයන්හි සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවට අනුව අයවැයගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම සැසඳීමේ දී අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.6,519,000ක් වැය කර තිබුණි. එසේම පළතුරු හා එළවළු, ඉලෙක්ට්‍රොනික් සහ යන්ත්‍ර, ඉදිකිරීම් හා සෞඛ්‍ය සේවා, අලෙවි/වෙළඳපල සංවර්ධන හා ICT/BMP යනාදි වැය ක්ෂේත්‍රයන් අතර සියයට 11 සිට සියයට 118 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 5.2.1 ඡේදය අනුව හා 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (3) වගන්තිය පරිදි මෙහෙයුම් කටයුතු මගින් ජනිත කිරීමට අපේක්ෂිත ආදායම් හා වියදම් යන දෙවර්ගයම සඳහා අපේක්ෂිත ප්‍රාග්ධන හා අයහාර අගයන් ඇතුළත් කර වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද 2016 වර්ෂය සඳහා මණ්ඩලය විසින් පිළියෙල කරන ලද අයවැය ලේඛනය තුළ ඇතුළත් කර තිබුණේ අපේක්ෂිත වියදම් පමණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 5.2.5 ඡේදය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 8(4) වගන්තිය පරිදි අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකළ අයවැය ලේඛනය වහාම රේඛීය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණු අතර විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ භාණ්ඩාගාර අනුමැතිය ලද අයවැය ලේඛනය නොව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අයවැය ලේඛනය විය.

**5.5 නොවිසඳී ඇති විගණන ඡේද**

---

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

**2015 වර්ෂය**

---

(අ) ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලින් ලබා දුන් රු.5,000,000 ක් වූ ණය මුදල නිරවුල් කර නොතිබුණි.

(ආ) 2013 මාර්තු 27 දින පෝලන්තයේ පැවැත් වූ ව්‍යාපාරික රැස්වීමක් සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ වියදම් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට ගෙවන ලද මුදලින් රු.127,465 ක් නිරවුල් කර නොතිබුණි.

(ඇ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 23(I) වගන්තියට පටහැනිව පත් කර තිබූ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ සඳහා 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.4,076,773 ක්, රාජකාරී හා පෞද්ගලික ගමන් සඳහා ලබාදී තිබූ වාහනයේ කුළී ලෙස රු.6,270,670 ක් හා විදේශ ගමන් සඳහා දීමනා හා ගමන් ගාස්තු ලෙස රු.2,122,770 ක් වශයෙන් එකතුව රු.12,470,213 ක් විධිමත් අධිකාර බලයකින් තොරව ගෙවා තිබුණි.

(ඇ) 2012 ජුනි 08 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝගය හා භාණ්ඩාගාර උපදෙස්වලට අනුකූලව කටයුතු නොකර, 2015 දෙසැම්බර් 31 දක්වා වාහන කුලියට ගෙන රු.11,703,560 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඉ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 2 (1) හා 13 (1), (2) වගන්ති අනුව 1992 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 23ක කාලපරිච්ඡේදය තුළදී අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව රැස්වී නොතිබුණ අතර අපනයන සංවර්ධන අරමුදල පිහිටුවා නොතිබුණි.

(ඊ) එක්ස්පෝ මිලානෝ වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූ නිලධාරීන් දෙදෙනෙකුට අග්‍රාමාත්‍ය අනුමැතිය ඉක්මවා රටෙන් බැහැරව සිටි කාලය සඳහා රු.605,803 ක් ගෙවා තිබුණි.

(උ) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව පසුගිය වසර 4 ක් තුළ වෘත්තීය දීමනාව රු.2,182,894 ක්, විශේෂ ජීවන වියදම් දීමනාව රු.18,284,887 ක් හා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා රු.12,458,798 ක් වැය කර තිබුණි.

(ඌ) 2015 මැයි 01 සිට 2015 ඔක්තෝබර් 31 දක්වා ඉතාලියේ මිලානෝහි පැවැත්වූ එක්ස්පෝ මිලානෝ ප්‍රදර්ශනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රු.4,440,336 ක් වැඩිපුර වැය කර තිබුණ අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව පත් කර තිබූ එක්ස්පෝ කොමසාරිස් ජනරාල්වරයාගේ ක්‍රියා කලාපය මත ශ්‍රී ලංකාවට අහිමි රු. 12,960,000 ක මුදල එම නිලධාරියාගෙන් අය කර ගෙන නොතිබුණි.

(එ) අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රු.5,040,000 ක මුදලක් එක්ස්පෝ ශ්‍රී ලංකා දිනය වෙනුවෙන් වෙන්කර තිබියදීත් මණ්ඩලයේ සභාපති සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම දිනය වෙනුවෙන් සහභාගී වීමට රු.1,079,688 ක් වැය කර තිබුණි.

(ඒ) එක්ස්පෝ ප්‍රදර්ශනයට පත් කර තිබූ මණ්ඩලයේ නිලධාරීන්ට 2015 මැයි 15 දිනැති අංක MF01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04(ඩී) වගන්තියට පටහැනිව විදේශ ගමන් දීමනා සඳහා රු.3,770,640 ක් ගෙවා තිබුණි.

(ඔ) 1971 අංක 38 දරන මුදල් පනතේ 25 වගන්තිය, 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව අනුමැතියකින් තොරව සේවක ණය අරමුදලක් පිහිටු වීමට හා ඊට මාසිකව සියයට 7.2 ක පොලියක් බැර කිරීමට 2015 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රදාන රු.2,567,531 ක් භාවිතා කර තිබුණි.

(ඕ) 2015 වර්ෂයේ විගණන වාර්තාවෙන් හඳුනාගන්නා ලද පාඩු රු.1,918,314 ක් පෙන්වා දුන්නද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2014 වර්ෂය**

**--------------**

(අ) දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවට අයත් ගොඩනැගිල්ලක මණ්ඩලයේ එක් ගබඩාවක් පවත්වා ගෙන යනු ලබන පරිශ්‍රයේ කොටසක් උප බදු දී තිබුණු අතර ඒ සඳහා උප බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බලතල හා කර්තව්‍යයන්ට පටහැනිව 2014 වර්ෂයේදී රු.4,020,848 ක වියදම් දරා තිබුණි.

(ඇ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 12(ට) වගන්තිය අනුව මණ්ඩලය විසින් 1988 වර්ෂයේ සිට පෞද්ගලික සමාගම්වල කර තිබුණු රු.929,548,150 ක් වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ආරක්ෂක සේවයේ රාජකාරී කළ බවට ව්‍යාජ අත්සන් යොදා ලබා ගත් රු.226,530 ක වැටුප් ආපසු අය කර ගෙන නොතිබුණි.

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයට අයත් වාහන 5 ක් සහ නිලධාරීන් 4 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා 2014 වර්ෂයේදී වාහන නඩත්තු වියදම්, කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.2,824,256 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

**2013 වර්ෂය**

**--------------**

(අ) ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 3.5 වගන්තියට පටහැනිව යතුරුපැදි ණය හා ආපදා ණය දීමේදී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 50 ක් ලෙස සලකා තිබුණි.

(ඇ) ඉන්දියාවේ චෙන්නායි නුවර 2004 සිට 2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 5 කින් අය විය යුතු හිඟ කුළී හා විදුලි ගාස්තු රු.7,049,858 ක් 2016 අගෝස්තු 15 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

**2012 වර්ෂය**

---------------

"හම්බන්තොට බටඅත" කර්මාන්ත වැඩසටහනේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පුද්ගලික සමාගමේ කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබුණු බැවින්, ආයෝජනය කළ මුදල් මණ්ඩලයට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ආයෝජන පාලනය | නිසි අනුමැතිය ලබා නොගැනීම හා පසු විපරම් නොකිරීම. |
| (ආ) | ණය පාලනය | අපනයන සමාගම් සමග ගිවිසුම් ඇති කර නොගැනීම හා ණය හා පොලිය අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | විශේෂ ව්‍යාපෘති පාලනය | මණ්ඩලයේ අරමුණුවලට පටහැනිව ව්‍යාපෘති ආරම්භ කිරීම හා ඉලක්කගත අරමුණු සපුරා ගැනීමකින් තොරව අතහැර දැමීම. |
| (ඈ) | අයවැය පාලනය | අයවැයගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා අයවැය ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් නොකිරීම. |